FACULTY OF GRADUATE STUDIES
RECEIVED
28 JUN 2012
UNIVERSITY OF KELANIYA

# ගැටුම් නිරාකරණය පිළිබඳ බෞද්ධ ආකල්ප විමර්ශනයක්

## (පන්සිය පණස් ජාතක පොත ඇසුරෙන් )

**එච්.ඩී.සරත් ජයපාල පියනම**

ලියාපදිංචි අංකය **F.G.S./3/2/8/2003/03**

B.A. පේරාදෙණිය

B.Th. සෙරැම්පෝ

M.S.Sc කැලණිය

Dip inTheology

ප්‍රවේශ අංකය 763
වර්ග අංකය

ශ්‍රී ලංකා කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා අංශයේ
දර්ශනපති **M.Phil** පශ්චාත් උපාධි පරීක්ෂණය

2010 - ජූනි -22

ගැටුම් නිරාකරණය පිළිබඳ බෞද්ධ ආකල්ප විමර්ශනයක්
( පන්සිය පණස් ජාතක පොත ඇසුරෙන් )

## 1.5 හැඳින්වීම

අප විසිඑක්වන සියවසට පැමිණෙන විට මුළු මහත් පෙර අපර දෙදිග ලෝකයේ විශාල නොසන්සුන්තාවයක් දිනෙන් දින වර්ධනය වෙමින් පවතියි . ජාත්‍යන්තර මට්ටමේ මෙන් රටවල් අභ්‍යන්තරයේද සිවිල් යුද්ධ , ජනවාර්ගික කොටස් අතර යුද්ධ , විවිධ දේශපාලන මත දරන කණ්ඩායම් අතර යුද්ධ , විවිධ ආගමික අන්තවාදී හෝ මූලධර්මවාදී ( **Religious fundamentalists** ) මතධාරී කණ්ඩායම් අතර කැරලි කෝලාහල , ගැටුම් , අර්බුද , ත්‍රස්තවාදය (**Terrorism** ) , රසායනික අවි නිෂ්පාදනය වැනි අංශවල සුවිශේෂී වේගවත් වර්ධනයක් දැකිය හැකිය . මෙම යුද්ධ , ගුවන් යානා භාවිතා කරමින් බෝම්බ හෙලීම , න්‍යෂ්ටික අවිවලින් පහරදීම , ගිනි අවි නොවන අවිවලින් ප්‍රතුපුත්තර සැපයීම ,බර අවිවලින් පහරදීම , සුළු අවිවලින් පහරදීම , ගිනි අවි නොවන අවිවලින් පහරදීම ආදී වශයෙන් අඩු හා වැඩි පරිමාණ වශයෙන් වර්ගකර දැක්විය හැකිය . විසිවන ශතවර්ෂයේ පමණක් පළමුවන හා දෙවන වශයෙන් මහා ලෝක සංග්‍රාම දෙකක් ඇතිවිය . කවුරුන් කෙසේ යුද්ධය සාධාරණීකරණය කළද යුද්ධය සමාජය විසංවිධානය කරයි . ජනවාර්ගික කොටස් අතර,ආගමික කොටස් අතර හා දේශපාලන පක්ෂ අතර අනුකලනය වෙනුවට (**Integration** ) වෙනුවට ව්‍යානුකලනය (**Disintegration** ) ඇති කරයි . මෙම තත්ත්වයන් සලකා බැලූ ලෝක ප්‍රජාව එක්සත් ජාතීන්ගේ සංවිධානය ( **United Nations Organization** ) මුලින් ජාතීන්ගේ සංවිධානය ( **Nations Organization** ) පවා පිහිටවනු ලැබුවේ , නැවත වතාවක් මෙවැනි ඛේදනීය යුද්ධ මේ මිහිතල මත ඇතිවීම සම්පූර්ණයෙන් වළක්වනු පිණිසය . ලෝකය ප්‍රධාන කොටස් දෙකකට බෙදා එදා මෙන් සටන් කරනු නොලැබුවද , රට රටවල් අතරත්, රටවල අභ්‍යන්තරයේත් ගිණිය නොහැකි තරම් ගැටුම් ප්‍රමාණයක් ඇතිව ඇති බව ඒ පිළිබඳ අධ්‍යනය කරන කල පැහැදිලිවෙයි . මර්දනය කරනු ලැබූ ගැටුම් යලි යලිත් හිස ඔසවනු පෙනෙයි . මෙම ගැටුම්වලින් අතිවිශාල පිරිසක් මියගොස් ඇති බව පැහැදිලිය.

පෙර අපර දෙදිග යුද්ධය හා සාමය පිළිබඳව චින්තනය සකස්වීමට මෙන්ම ගැටුම් විපරිවර්තනය (**Conflict Transformation** )සම්බන්ධයෙන්ද ඒ ඒ ජනතාවට තම දේශයේ, කලාවේ , සංස්කෘතියේ බලපෑම ලැබී ඇත . උදාහරණයක් ලෙස ඉස්ලාම් ජනයා අතර යුද්ධය හා සාමය යන දෙඅංශයටම ආගමික වශයෙන් පර්යාලෝකයක් (**Perspectives**) ලැබී ඇත . උදාහරණයක් ලෙස ඉස්ලාම් ජනයා අතර යුද්ධය හා සාමය යන දෙඅංශයටම ආගමික වශයෙන් පර්යාලෝකයක් (**Religious perspectives** ) ලැබී ඇත . එහිදී ශුද්ධ යුද්ධ ( **Holy war** ) යන අදහසත් අදහසත් ,සාමය පිළිබඳ සලාම් අලේකුම් (හෙබ්‍රෙව් බසින් ෂලාම් අලේඛෙම් ) යන්නද ඉතා වැදගත් වෙයි ශ්‍රී ලංකාවේ නම් මෙම සංකල්පවලට මූලිකවම බෞද්ධ ජීවන ක්‍රමය බලපා ඇත .

බෞද්ධ ජීවන ක්‍රමය තුළ "පින", "පිං" යන තේරුම් ගැනීම ඉතා වැදගත් කමක් උසුලනු ලබයි. අපගේ පෙර රජ සමයේ සිටම ගමනක් බිමනක් යන මගීන්ට මහමග පවස නිවා ගැනීම සඳහා වතුර භාජනයක් තබා තිබුනේ පිං පිණිසය. එය පින්තාලිය (පැන්තාලිය) නම්වෙයි. (වර්තමානයේ නම් එලෙස ගමන් බිමන් යන මගීන් පවස නිවා ගන්නේ බෝතල් කරන ලද ජලය මිලට ගැනීමෙනි) එලෙස ගමන් බිමන් යන්නන්ට වෙහෙස නිවා ගැනීම සඳහා අම්බලම් තනවා තිබිණි. (වර්තමාන සමාජයේ ඒවා වෙනුවට තානායම්, චීන අවන්හල් ඇත.) එලෙස ගමන් බිමන් යන්නෝ අම්බලමේ නැවති වෙහෙස නිවා ගත්හ. රැය පහන් කළහ. මේ සියල්ල "පින" යන බෞද්ධ ඉගැන්වීම මත සකස්වූ ඒවාය. "පිං ලිඳ", "පිං ගොනා", "පිං කයිය", බෞද්ධ ජීවන ක්‍රමය තුළින් අප ලද දායාදයන්ය

පහත සඳහන් ජනකවිය තුළ කියැවෙන්නේද තමන්ට නෙලා ගන්නට නොහැකිමුත් අන් අය වෙනුවෙන් මල් පිපෙන්න යැයි කෙරෙන්නාවූ ප්‍රාර්ථනයකි.

"මැදවත්තේ සෙල්ලම් පාරකි යන්න
මල් පිපිලා සුවඳේ බැරුවා ඉන්න
නෙලා ගන්න මගෙ අත දිග නැහැ උසට
සාදු සාදු මල් පිපියන් හොඳ රුවට"

(ජනකවි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අත්තනායක එම්. හේරත් මහතා පේරාදෙණිය සරසවියේ කිතුනු දේවස්ථානයේ 2007-12-10 දින කළ දෙසුමකිනි)

මෙවැනි පරාර්ථකාමී චින්තනයක් සකස්වීමට බුදුදහමේ බලපෑම මොනවට පැහැදිලි වෙයි. ගැටුම් නිරාකරණ විෂයේදී ද අප මුතුන් මිත්තෝ ඉතා සාධාරණ පිළිවෙත් අනුගමනය කරන ලද බවට මෙම ජන කවිය දෙස් දෙයි.

පින් ඇති අතපත්තු මට කාරියා
මං කළ කුඹුර වපුරන්නට නැරියා
ගල් මුල් උහුලන්න මං කරපු වීරියා
නඩු නැති රටට මොට පායාද සූරියා

(ජනකවි - එම දෙසුමෙනි)

වැට මායිම්වලට අවි ආයුධ හරස්කර ගන්නා මෙවන් වකවානුවක තමන්ට සිදුවන අසාධාරණයට එරෙහිව එදා ජන කවිය පාවිච්චි කර ඇති අපූරු ආකාරය මෙයින් පැහැදිලි වෙයි. එහි උපහාසය සංයමයකින් යුතුව ගෙන හැර පායි. මෙම සංයමය, විනය, ධාර්මික සිතිවිලි ජන කවියාට පහළවූයේ බෞද්ධ සිතිවිලි සමුදාය මගිනි. නැතහොත් බෞද්ධ ජීවන ක්‍රමය මගිනි.

එලෙස බෞද්ධ ජීවන ක්‍රමයේ හෘදය නැතහොත් ශ්‍රී ලාංකේය ජන ජීවිතයේ හෘදය තීරණය කළාවූ පූජනීය ග්‍රන්ථය පන්සිය පණස් ජාතක පොතයි .

ඉන්දියාව වැනි රටවල ජීවන ක්‍රම නීති ක්‍රම සකස්වීමට බලපානු ලැබුවේ රාමායනය , මහාභාරතය වැනි සාහිත්‍යයන්ය . අපරදිග චින්තනය සකස්වීමට ශුද්ධ බයිබලය , ග්‍රීක නාට්‍යය , ෂේක්ස්පියර්ගේ නාට්‍යය ඇතුළු වෙනත් නාට්‍යයන් හා ජනශ්‍රැතීන් මුල්වී ඇතිබව පෙනේ .

"පුරාණයේ ජාතක කතාව පරිශීලනය කළේ හුදෙකලාව නොවේ. ඒවා විහාරස්ථාන ආශ්‍රිතව වියත් භික්ෂූන්වහන්සේගේ මග පෙන්වීම අනුව සාමාන්‍ය ජනයා අධ්‍යයනය කළෝය. කෘෂිකාර්මික අර්ථ ක්‍රමයක ජීවත්වූ ඔවුන් සවසට විහාරස්ථානයේ බණ මඩුවට රැස්වූයේ ධර්ම දේශනාවලට සවන් දීමටය. පොත් පත් කියවීමට තරම් මුද්‍රණ කර්මාන්තයේ දියුණුව තිබූ නොමැති සමයක, පොත් පත් සියල්ල රැස්කොට තිබුණේ පොත් ගුල් විහාරවලය. අප වියත් භික්ෂූහු බණ මඩුවට රැස්වෙන උපාසක උපාසිකාවන්ට ධර්මයෙන් අනුශාසනා කළහ. එහි අප හිමිවරුන් භාවිතා කරනු ලැබූ පුස්තකයන් අතර සද්ධර්මාලංකාරය, සද්ධර්මරත්නාවලිය, පන්සිය පණස් ජාතක පොත සුවිශේෂ තැනක් හිමිකර ගත් අතර අකුරු ශිල්පය නොදත් නමුත් දහමින්, බුද්ධියෙන් වියත්වූ එම ජනයා යහපත් දිවි පෙවතක් ගත කළෝය. අද මෙන් කිසිදු දේශපාලනඥයෙකුට ජනතාව රැවටිය නොහැකි වූයේ පන්සිය පණස් ජාතක පොත අධ්‍යයනයෙන් ඔවුන් බුද්ධිමත්ව සිටි බැවිනි." (ආගමික කටයුතු හා සදාචාර වර්ධන අමාත්‍යංශයේ උපදේශක පූජ්‍ය ශාස්ත්‍රපති ගලගම ධම්මරංසි හිමි සමඟ 2008 - දෙසැම්බර් 16දා එම අමාත්‍යංශ කාර්යාලයෙහිදී කළ සාකච්ඡාවක් ඇසුරෙනි.)

මින් පැහැදිලි වන්නේ සියලු ගැටුම් විසඳා ගැනීමට පන්සිය පණස් ජාතක පොත ජනතාකරණය වී තිබූ බවයි. එදා ජාතක පොත යම් කිසි බණකට ගෙන යනු ලැබුවේ විශේෂ ගෞරවයක් සහිතව හිස මතිනි. එය ආමන්ත්‍රණය කරනු ලැබුවේ පන්සිය පණස් ජාතක පොත් වහන්සේ නැමැති ගෞරව නාමයෙනි. නමුත් වර්තමානයේ පන්සිය පණස් ජාතක පොත හුදෙකලාව විහාරවල කෞතුක වස්තුවක් වී ඇත. එය අද භාවිතා කරනු ලබන්නේ ඒ පිළිබඳව පර්යේෂණ කටයුතුවල නිරතවන මහාචාර්යවරුන්, ආචාර්යවරුන් හෝ උසස් අධ්‍යාපනය හදාරන විද්‍යාර්ථයින්ය.

ශ්‍රී ලාංකේය සමාජ සන්දර්භය තුළ සමකාලීන ප්‍රශ්න පිළිබඳව සලකා බලන කල ගැටුම් නිරාකරණ විෂය ඉදිරියට පැමිණ ඇති බව පෙනෙයි. උතුරු හා නැගෙනහිර සන්නද්ධ කණ්ඩායම් හා ගැටුම් පැවැති දශක තුනක පමණ කාලයක් පුරා බොහෝ විද්වතුන් ගැටුම් පිළිබඳව අධ්‍යයනයට පෙළඹුණි. පසුගිය දශක කිහිපය තුළ ලෝකයේ බොහෝ රටවල විශ්ව විද්‍යාලවල ගැටුම් නිරාකරණය විෂය දේශපාලන විද්‍යා සහ සමාජ විද්‍යා විෂය පථවලට අන්තර් ග්‍රහණය කරගන්නා ලදී. ශ්‍රී ලංකාවේද කොළඹ, පේරාදෙණිය හා රුහුණු විශ්වවිද්‍යාලවල ගැටුම් පිළිබඳ අධ්‍යයනය දේශපාලන විද්‍යා සහ සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රවලට ඇතුලත් කර ගෙන ඇත. මෙම විෂය සම්බන්ධව ලොව පුරා වියතුන් බිහිවී තිබේ.

ශ්‍රී ලංකාවේ ගැටුම් නිරාකරණය සම්බන්ධයෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන කටයුතු කිරීම පසුගිය දශක දෙක තුළ ආරම්භ කරන ලදී. රාජ්‍ය අංශයේ ප්‍රධාන දායකත්වය මේ සඳහා ලබාදුන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යංශයයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඇති කිරීම තුළ ගැටුම් නිරාකරණය කිරීම පිළිබඳ ඔවුහු අවධානය යොමු කළෝය. විශේෂයෙන් එම අමාත්‍යාංශය යටතේ පවතින සාමය ගොඩ නැගීමේ ඒකකය (Peace Building Unit) ජාතික ඒකාබද්ධතා වැඩසටහන් ඒකකය (National integration Programme) සුවිශේෂයෙන් සඳහන් කළ හැකිය. මේ හැරුණු විට මෙම විෂය කෙරෙහි රාජ්‍ය නොවන සංවිධානද (NGO), එම සංවිධානවලට මූලාධාර සපයන්නන්ද උනන්දුවක් දැක්වූ බව පෙනෙයි. උදාහරණ ලෙස දේශපාලනික සහ ගැටුම් පරිවර්තනය පිළිබඳ ප්‍රයත්නය (ඉම්පැක්ට්), විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ක්‍රිස්තියානි කම්කරු සහෝදරත්වය, සර්වෝදය, ඇතුළු බොහෝ සංවිධාන මේවාට උදාහරණ වෙයි.

ගැටුම් විපරිවර්තනය පිළිබඳ වැඩසටහනේ බොහෝ විට තම ඉලක්කය කරා යෑමට ඔවුන් භාවිතා කරනු ලබන්නේ බටහිර ආකෘතින්ය. බටහිර සංකල්පයන්ය. ශ්‍රී ලංකාවේ ගැටුම් පිළිබඳ අධ්‍යයනය කිරීමටත්, ඒවාට විසඳුම් සෙවීමටත් ශ්‍රී ලංකාවෙන්ම අවශ්‍ය අමුද්‍රව්‍ය සොයා ගත හැකිය. විශේෂයෙන්ම පන්සිය පණස් ජාතක පොත් වහන්සේ තුළ ඇති කථා වස්තූන් ගැටුම් නිරාකරණ විෂයෙහිලා අර්ථවත් ලෙස යොදා ගත හැකි බවත්, එහි ඇති දේශපාලනික ගැටුම්, සමාජීය ගැටුම්, පවුල් සංස්ථාවේ ගැටුම්, පෞද්ගලික ගැටුම් ආදිය සර්වකාලීන ගුණයෙන් යුක්ත බවත් පූජ්‍ය මහාචාර්ය කුඹුරුගමුවේ වජිර නාහිමි විසින් පැවසුසේක. (සබරගමුව විශ්ව විද්‍යාලයේ කුලපති පූජ්‍ය මහාචාර්ය කුඹුරුගමුවේ වජිර නාහිමියන් සමග 2009 ජනවාරි 20දා විද්‍යාලංකාර පිරිවෙණේදී පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකිනි.)

ගැටුම් විපරිවර්තනය පිළිබඳ පන්සිය පණස් ජාතක පොතේ විෂයට අදාල කථා වස්තූන් පමණක් තෝරා ගෙන දර්ශනපති උපාධිය අවශ්‍යතා සැපිරීමේ අරමුණින් මෙම නිබන්ධය ඉදිරිපත් කරමි.